*සැ. යු.* - 2026.07.10 පළ වූ 2497 ගැසට් පත්‍රයේ IV (අ) කොටස පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,498 - 2026 ජූලි මස 17 වැනි සිකුරාදා - 2026.07.17**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## III කොටස - ඉඩම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම් : | |
| ප්‍රාරම්භක දැන්වීම් .... ... ... ... | — |
| අවසාන නියෝග .... ... ... ... | — |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා දැන්වීම් ... ... | — |
| ආණ්ඩුවේ ඒජන්තවරු විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරි විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් .... ... ... | — |
| ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් .... ... | 238 |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් .... ... | — |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම .... ... | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් .... ... | 240 |

*සැ. යු.* - සත්ව සුබසාධන පනත් කෙටුම්පත 2026 ජූලි මස 17 දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාර ගැනීම ගැසට් පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තතු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2026 අගෝස්තු මස 07 වැනි දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2026 ජූලි මස 24 දින දහවල් 12.00 ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාර දිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**ප්‍රසන්න ජයරත්න,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2026 ජනවාරි මස 02 දින ,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම්

**ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය**

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වගන්තියේ (04)
උප වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය
අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

වයඹ පළාත් සභාවේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඇහැටුවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ''එච් කලාපයේ නේවාසික ව්‍යාපාර කළමණාකාර කටුකුරුන්ද ගමගේ සුදසුන් පද්මකුමාර වන මම ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19(4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් 2008.08.07 දින ප්‍රදානය කර ඇති අංක කුරු/එච්/මීග/ප්‍ර/3177(වාරි) දරන ප්‍රදානපත්‍රයේ හිමිකරු වන අන්දරවැව, වැලියාව, මීගලෑව පදිංචි රත්නායක මුදියන්සේලාගේ කුඩා බණ්ඩා යන අය වෙත ප්‍රදානය කොට නිකවැරටිය දිස්ත්‍රික් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක 876 යටතේ 2009.04.21 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2026.08.07 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

**උපලේඛනය**

කුරුණෑගල පරිපාලන දිස්ත්‍රික්කයේ ඇහැටුවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 103, වැලියාව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ වැලියාව නැමැති ගමේ පිහිටා ඇත්තාවූ ද කුරුණෑගල මිනින්දෝරු අධිකාරිය භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක අ. ග. පි. 3982/7 දරන කට්ටි කැඩීමේ පිඹුරේ අංක 386 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.706ක් විශාලත්වය ඇත්තාවූ ද පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම :

| | |
|---|---|
| *උතුරට* | : අංක ල. මැ. ග. පි. 3976 |
| *නැගෙනහිරට* | : අංක 387, 389 බිම් කැබලි |
| *දකුණට* | : අංක 389, 385 බිම් කැබලි |
| *බස්නාහිරට* | : අංක 385, ල. මැ. ග. පි. 3976 |

ඉංජි. කේ. ජී. එස්. පද්මකුමාර,
නේවාසික ව්‍යාපාර කළමනාකාර,
ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය,
එච් කලාපය - තඹුත්තේගම.

2026 ජනවාරි මස 13 වැනි දින.

07-230

**ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය**

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වගන්තියේ (04)
උප වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය
අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

උතුරු මැද පළාත් සභාවේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ එච් කලාපයේ නේවාසික ව්‍යාපාර කළමණාකාර කටුකුරුන්ද ගමගේ සුදසුන් පද්මකුමාර වන මම ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19(4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් 2005.10.06 දින ප්‍රදානය කර ඇති අංක අනු/එච්/නො/ප්‍ර/4187 (වාරි) දරන ප්‍රදානපත්‍රයේ හිමිකරු වන 412/8/80, ගාලදිවුල්වැව පදිංචි ඉහල හේනයලාගේ ගෙදර රිදී අය වෙත ප්‍රදානය කොට අනුරාධපුර දිස්ත්‍රික් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක 1856 යටතේ 2006.06.01 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2026.08.07 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

**උපලේඛනය**

අනුරාධපුර පරිපාලන දිස්ත්‍රික්කයේ නොච්චියාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ විලච්චිය පත්තුවේ/කෝරලේ 342 ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ 205, දොඹවලගම නැමැති ගමේ පිහිටා ඇත්තාවූද, අනුරාධපුර, මිනින්දෝරු අධිකාරිය භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක අ. ජ. පි. 205 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි/ - විසින් සම්පාදිත අංක - දරන කට්ටි කැඩීමේ පිඹුරේ /- විසින් සම්පාදිත අංක - දරන රේඛා සටහනේ අංක 16 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද ප්‍රමාණයෙන් හෙක්ටයාර් 1.000 ක් විශාලත්වය ඇත්තාවූද පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම.

| | |
|---|---|
| *උතුරට* | : අංක 18 බිම් කැබැල්ල |
| *නැගෙනහිරට* | : අංක 15, 13 බිම් කැබැලි |
| *දකුණට* | : අංක 13, 17 බිම් කැබලි |
| *බස්නාහිරට* | : අංක 17, 18 බිම් කැබලි |

ඉංජි. කේ. ජී. එස්. පද්මකුමාර,
නේවාසික ව්‍යාපාර කළමනාකාර,
ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය,
එච් කලාපය - තඹුත්තේගම.

2026 ජනවාරි මස 26 වැනි දින.

07-229

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වගන්තියේ (04) උප වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

දකුණු පළාත් සභාවේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් ඉසංක ලක්මාල් වික්‍රමනායක වන මම, ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19(4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1999.05.20 දින ප්‍රදානය කර ඇති අංක හම්/11/ප්‍ර 51412 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන අංක 573, කුඩා ගම් 08, දකුණු ඉවුර, ලුණුගම්වෙහෙර හි පදිංචි සින්නයියා සාමිනාදන් වෙත ප්‍රදානය කොට හම්බන්තොට දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක හම්/303/4275/99 යටතේ 1999.10.21 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 උප වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2026.08.07 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

#### උපලේඛනය

හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කයේ ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මාගම් පත්තුවේ/කෝරළේ රණසිරිපුර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ දකුණු ඉවුර, කුඩාගම් 08 නැමැති ගමේ පිහිටා ඇත්තා වූ ද ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් භාරයේ ඇති සහ අංක ............ දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි/ ......... විසින් සම්පාදිත අංක ............ දරන කට්ටි කැඩීමේ පිඹුරේ/ ....... විසින් සම්පාදිත අංක ............. දරන රේඛා සටහනේ අංක 573 නිවාස දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූද ප්‍රමාණයෙන් හෙක්ටයාර්/අක්කර - රූඩ් 02 පර්චස් - ක් විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම

*උතුරට* : අංක 574 නිවාස ඉඩම
*නැගෙනහිරට* : අංක 629 නිවාස ඉඩම
*දකුණට* : අතුරු මාර්ගය
*බස්නාහිරට* : අතුරු මාර්ගය

අයි. එල්. වික්‍රමනායක,
ප්‍රාදේශීය ලේකම්,
ලුණුගම්වෙහෙර.

2026 මාර්තු මස 19 වැනි දින.

07-204/1

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වගන්තියේ (04) උප වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

දකුණු පළාත් සභාවේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ බෙලිඅත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් ජීවනි ගංගා රුවන්පතිරණ වන මම, ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19(4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1982.06.23 දින ප්‍රදානය කර ඇති අංක හම්/ප්‍ර/22 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන අම්බල්, මිරිස්වත්තේ පදිංචි රිචඩ් ජයවර්ධන වෙත ප්‍රදානය කොට තංගල්ල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක 22 යටතේ 1982.09.07 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2026.08.07 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

#### උපලේඛනය

හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කයේ බෙලිඅත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දකුණු ගිරුවාපත්තුවේ අම්බල (වර්තමානයේ මිරිස්වත්ත) ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ අම්බල, මිරිස්වත්තේ නැමති ගමේ පිහිටා ඇත්තාවූ ද, සර්වේ ජනරාල්වරයා භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක අ. ග. සි. දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි අංක 300 දරන කට්ටි කැඩීමේ පිඹුරේ අංක 347 දරන බිම් කැබැල්ල වශයෙන් නිරූපණය කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් රූඩ් 02 පර්චස් 01ක් විශාලත්වය ඇත්තාවූද, මිරිස්වත්ත යනුවෙන් හඳුවන්වනු ලබන පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම,

*උතුරට* : ලොට් 344 දරන අම්බල සිට මිරිස්වත්ත දක්වා ප්‍රවේශ පාරද
*නැගෙනහිරට* : ලොට් 353 දරන ප්‍රවේශ පාර ද,
*දකුණට* : ලොට් 348 දරන ප්‍රවේශ පාර ද,
*බස්නාහිරට* : ලොට් 346 සහ 258 දරන බිම් කැබලිද වේ.

ජේ. ගංගා රුවන්පතිරණ,
ප්‍රාදේශීය ලේකම්,
බෙලිඅත්ත.

2025 දෙසැම්බර් මස 12 වැනි දින.

07-204/2

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වගන්තියේ (04) උප වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

නැගෙනහිර පළාත් සභාවේ, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, කන්තලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් (අන්තර් පළාත්) ඉඩම් කොමසාරිස්/සහකාර ඉඩම් කොමසාරිස් බී. ඊ. කෞෂල්‍යා කුරේ වන මම, ඉඩම සංවර්ධන ආඥා පනතේ 19 වන උප වගන්තිය යටතේ ජනාධිපති විසින් 1995.07.27 දින ප්‍රදානය කර ඇති අංක ත්‍රි. කන්. ප්‍ර. 3545 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන අංක. 47, කෝවිල්ගම, කන්තලේ පදිංචි බණ්ඩා සිංගරාජා වෙත ප්‍රදානය කොට ත්‍රිකුණාමලය දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක OLD/KA /29/63 යටතේ 1998.05.05 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2026.08.07 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

**උපලේඛනය**

ත්‍රිකුණාමලය පරිපාලන දිස්ත්‍රික්කයේ කන්තලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කන්තලේ පත්තුවේ/කෝරළේ කන්තලේ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ කන්තලේ, කෝවිල්ගම නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, - භාරයේ ඇති සහ සර්වේයර් ජනරාල්වරයා විසින් සම්පාදිත අංක - දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි/ - විසින් සම්පාදිත අංක පී. පී. ත්‍රි. 204 දරන කට්ටි කැඩීමේ පිඹුරේ/ - විසින් සම්පාදිත අංක - දරන රේඛා සටහනේ අංක 47 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර්/අක්කර 0.040 රූඩ් - පර්චස් - ක් විශාලත්වය ඇත්තාවූ ද පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම (ගොඩ).

*උතුරට* : කැබලි අංක 38
*නැගෙනහිරට* : කැබලි අංක 46
*දකුණට* : කැබලි අංක 44
*බස්නාහිරට* : කැබලි අංක පී. පී. 5430/7

බී. ඊ. කෞෂල්‍යා කුරේ,
නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්,
සහකාර ඉඩම් කොමසාරිස් කාර්යාලය,
කන්තලේ.

2026 මැයි මස 12 වැනි දින.

07-279

# ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

*ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය :* 4/10/72983.
*පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය :* PLC/L2/23/08/24-2017.

**21 (2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි**

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ මහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 287බී කිරිල්ලවල දකුණ ග්‍රාම නිලධාරී වසමේ රම්මුතුගල ගමේ මු. පි. ගම්. 401 හි කැබලි අංක 07 දරන ප්‍රමාණයෙන් හෙක්. 0.0920 ක් පමණ වූ රජයේ ඉඩම් කොටස නේවාසික කටයුතු සඳහා ලද්දුව හෙට්ටිගේ පියසීලි මිය විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ. :-

*උතුරට* : කැබලි අංක 13 (පාර);
*නැගෙනහිරට* : කැබලි අංක 06;
*දකුණට* : වී. පී. පී. පීරිස් හිමිකම් කියන රම්මුතුගලවත්ත;
*බටහිරට* : කැබලි අංක 16 හා 09.

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ. :

*(අ)* *පළමු බදු කාලය* .- අවුරුදු තිහ (අවු. 30) යි. (1989.08.23 දින සිට 2019.08.22 දින දක්වා);

*වාර්ෂික බදු මුදල* .- ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත, 1989 වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 4% කි.

වාර මුදල : වාර්ෂික බදු මුදල මෙන් තුන් ගුණයකි;

*(ආ)* *දෙවන බදු කාලය* .- අවුරුදු තිහ (අවු. 30) යි. (2019.08.23 දින සිට 2049.08.22 දින දක්වා);

*වාර්ෂික බදු මුදල* .- පළමු බදු කාලය අවසානයේ අයකළ බදු මුදලට 50% ක් එකතු කර ලබා ගන්නා අගය දෙවන බදු කාලයේ ආරම්භක බදු මුදල වේ.

වාර මුදල : අය නොකෙරේ;

*(ඇ)* මෙම ඉඩම පදිංචියට නිවාසයක් තැනීම සඳහා මිස වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය;

*(ඈ)* ඉඩමේ භුක්තිය භාර දී අවුරුද්දක් ඇතුලතදී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි සංවර්ධනය කළ යුතු ය;

*(ඉ)* ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලටද මෙම බද්ද යටත් විය යුතු ය;

*(ඊ)* සාදා ඇති/සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්වයකින් පවත්වාගෙන යා යුතුය.

*(උ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණු සාක්ෂාත් කර ගැනීමට නියමිත කාලසීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ;

*(ඌ)* 1989.08.23 දින සිට අවුරුදු 05ක් ගතවන තුරු පවුල තුළ පැවරීම් හෝ මෙම ඉඩම බදුගත් කරුණු සාක්ෂාත් කර ගැනීම සඳහා වන අතුරු බදු හෝ පැවරීම් හැර වෙනත් අතුරු බදු දීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ. මෙම ඉඩම සඳහා දීමනා පත්‍රයක් ලබා ගැනීමේ හිමිකම ඉඩමේ නිවසක් ඉදිකර සංවර්ධනය කර ස්ථිරව පදිංචි වූ පසුව හා ඉඩමේ නොදියුණු වටිනාකම හා වාර මුදල/දඩ මුදල එකවර ගෙවීමෙන් පසුව හිමි වේ.

*(එ)* බදු කුළිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත. බදුගෙවීම අඛණ්ඩව සිදු නොකර ඇති අවස්ථාවකදී ගෙවිය යුතු හිඟ බදු සඳහා 10% ක දඩ පොළියක් අයකරනු ලැබේ.

*(ඒ)* නිවාස ඉදිකිරීම් කටයුතු සඳහා ඉඩම අන්සතු කිරීමේදී නියම කරන ලද කාලසීමාව තුළ නිවාස කටයුතු සම්පූර්ණ කළ යුතු අතර, එසේ කිරීමට අසමත් වුවහොත් දීර්ඝකාලීන බදුකරය අහෝසි වූවා සේ සැලකෙන අතර, රජය වෙත නැවත ඉඩම පැවරීමට සිදු වේ.

මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ කළ දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

එස්. වී. ඒ. ඩී. ඉෂාරා එම්. සමරතුංග,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2026 ජූනි මස 30 දින,
ඉඩම් මහලේකම් කාර්යාලය,
අංක 1200/6,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර, බත්තරමුල්ල,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

07-283